# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2026 අංක 13 දරන සමථකරණ
# (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත

---

**[සහතිකය සටහන් කළේ 2026 ජූනි මස 30 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2026 ජූලි මස 03 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 60.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2026 අංක 13 දරන සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත**

[සහතිකය සටහන් කළේ 2026 ජුනි මස 30 වන දින]

එල්.ඩී. - ඕ 8/2025

**සිවිල් සහ වාණිජ ආරාවුල් සමථකරණය සඳහා ද; 2000 අංක 44 දරන ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනත ඉවත් කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හා ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1**. මේ පනත 2026 අංක 13 දරන සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. (ලුහුඬු නාමය)

**2.** (1) මේ වගන්තියේ (2) වන උපවගන්තියට යටත්ව, මේ පනතේ විධිවිධාන, සමථකරණ ගිවිසුමක් ප්‍රකාරව හෝ එවැනි ගිවිසුමක් නොමැති විට ආරාවුලේ යම් පාර්ශ්වයක් විසින් සමථකරණයට ස්වේච්ඡාවෙන් යොමු කරන ලද හෝ අධිකරණයක් විසින් යොමු කරන ලද (මෙහි මින් මතු "ආරාවුල්" යනුවෙන් සඳහන් කරනු ලබන) සිවිල් සහ වාණිජ ආරාවුල්, මේ පනතේ විධිවිධානවලට අනුව සමථකරණය මගින් නිරවුල් කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. (මේ පනත අදාළ වීම)

(2) මේ පනතේ විධිවිධාන, 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත හෝ 2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරාවුල්) පනත ප්‍රකාරව සමථකරණය මගින් ආරාවුල් නිරවුල් කිරීම සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(3) 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත හෝ 2003 අංක 21 දරන සමථ මණ්ඩල (විශේෂ වර්ගවල ආරාවුල්) පනත ප්‍රකාරව සමථකරණය සඳහා ඉදිරිපත් කිරීමට නියම කර ඇති කිසිදු ආරාවුලක් මේ පනතේ විධිවිධාන ප්‍රකාරව සමථකරණය සඳහා ඉදිරිපත් නොකළ යුතු ය.

**3**. මෙහි උපලේඛනයේ දක්වා ඇති යම් ආරාවුලක් ඇතුළුව අධිකරණ තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් මත පමණක් බලාත්මක කරනු ලැබිය හැකි නියම ඇතුළත් කර නිරවුල් කිරීමට (සමථකරණය කළ නොහැකි ආරාවුල්)

අවශ්‍ය වන්නා වූ යම් ආරාවුලක් සම්බන්ධයෙන් සමථකරණය සිදු නොකළ යුතු ය:

එසේ වුව ද, අදාළ නීතියට අනුකූලව නඩු තීන්දුවකට, තීන්දු ප්‍රකාශයකට හෝ ආඥාවකට ඇතුළත් කිරීමට සලකා බලනු පිණිස අධිකරණය වෙත නිරවුල් කිරීමේ නියම ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා එකී ආරාවුල්වලට අදාළ කාරණා සමථකරණය කරනු ලැබිය හැකි ය.

සමථකරණ ගිවිසුම

**4.** (1) පාර්ශ්වයන් විසින්, සමථකරණය මගින් නිරවුල් කළ හැකි ගිවිසුම්ගත හෝ අන්‍යාකාරයෙන් වන යම් අර්ථ දක්වන ලද නෛතික සම්බන්ධතාවයක් සම්බන්ධයෙන් ඔවුන් අතර පවත්නා හෝ පැන නැගිය හැකි යම් ආරාවුලක් සමථකරණය මගින් නිරවුල් කිරීම සඳහා යොමු කිරීමට ඒ ගිවිසුමක වගන්තියක් වශයෙන් වන හෝ ලිඛිත වෙනම ගිවිසුමක් වශයෙන් වන සමථකරණ ගිවිසුමකින් එකඟ විය හැකි ය.

(2) සමථකරණ ගිවිසුමක, සමථකරණ සේවා සපයන්නාගේ නම, සමථකරණය සිදු කිරීමේ දී අදාළ කර ගත යුතු රීති සහ සමථකරණය කර අවසන් කළ යුතු කාලසීමාව ඇතුළුව සමථකරණය සිදු කිරීම සම්බන්ධයෙන් පාර්ශ්වයන් විසින් එකඟ වන්නා වූ යම් නියමයන් ඇතුළත් කළ හැකි ය.

සමථකරණය සඳහා පාර්ශ්වයන් එකඟ වී ඇති අවස්ථාවක දී, සමථකරණය කර අවසන් වීමට පෙර අධිකරණ නඩු කටයුතු පැවරීම හෝ භාර ගැනීම නොකළ යුතු බව

**5.** (1) සමථකරණ ගිවිසුමක් ප්‍රකාරව හෝ සමථකරණ ගිවිසුමක් නොමැතිව වුව ද, මේ පනත ප්‍රකාරව සමථකරණ කටයුතු ආරම්භ කර ඇති අවස්ථාවක දී, යම් ආරාවුලක පාර්ශ්වයන් විසින් සමථකරණය කිරීම සඳහා එකඟ වී ඇති අවස්ථාවක දී, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ නඩු කටයුත්තේ නඩු නිමිත්ත සංස්ථාපනය කරන්නා වූ ඒ ආරාවුල සම්බන්ධයෙන් නිරවුල් නොකිරීමේ සහතිකයක් ඉදිරිපත් කර ඇත්නම් මිස, ඒ ආරාවුල සම්බන්ධයෙන් කිසිදු නඩු කටයුත්තක් අධිකරණයේ පැවරීම හෝ අධිකරණය විසින් භාරගැනීම සිදු නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන, එහි සඳහන් ආරාවුලක පාර්ශ්වයන් විසින් සිවිල් නඩු විධාන සංග්‍රහයේ V වන කොටස යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ වන යම් තාවකාලික ප්‍රතිකර්මයක් සම්බන්ධයෙන් සහනයක් ඉල්ලා සිටින අවස්ථාවක දී, අදාළ නොවිය යුතු අතර, ඒ තාවකාලික ප්‍රතිකර්මය ප්‍රදානය කිරීම සඳහා අදාළ වන ප්‍රමාණයට පමණක් එවැනි යම්

කාරණයක් සම්බන්ධයෙන් පවරන ලද යම් නඩුවක් අධිකරණයක් විසින් භාරගෙන තීරණය කරනු ලැබිය හැකි ය.

සමථකරණය සිදුවන කාලසීමාව තුළ කාලාවරෝධය අදාළ නොවිය යුතු බව

**6**. යම් නඩු නිමිත්තක් සම්බන්ධයෙන් කාලාවරෝධී කාලසීමාව ගණනය කිරීමේ දී, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, සමථකරණය ආරම්භ කරනු ලබන දිනයෙන් ආරම්භ වී, අවස්ථාවෝචිත පරිදි, නිරවුල් කිරීමේ ගිවිසුමේ හෝ නිරවුල් නොකිරීමේ සහතිකයේ දිනයෙන් අවසන් වන කාලසීමාව ඒ ගණනය කිරීමෙන් බැහැර කරනු ලැබිය යුතු ය.

අධිකරණය විසින් සමථකරණයට යොමු කිරීම

**7**. (1) යම් ආරාවුලක් සම්බන්ධයෙන් නඩුවක් ගොනු කරනු ලැබ ඇත්තේ යම් අධිකරණයක ද ඒ අධිකරණය විසින් අදාළ සියලු අවස්ථානුගත කරුණු සලකා බැලීමෙන් පසු, ස්වකීය අභිමතය පරිදි, ආරාවුල හෝ එහි යම් කොටසක් හෝ සමථකරණය මගින් නිරවුල් කිරීම සඳහා යොමු කිරීම සුදුසු ද යන්න නිශ්චය කළ හැකි අතර, එසේ නිශ්චය කරනු ලැබුවහොත්, පාර්ශ්වයන් විසින් තෝරා ගන්නා ලද සමථකරණ සේවා සපයන්නකු විසින් පරිපාලනය කරනු ලබන සමථකරණය වෙත ආරාවුල හෝ එහි යම් කොටසක් හෝ යොමු කරමින් අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව ආරාවුල යොමු කරනු ලැබුවේ යම් සමථකරණ සේවා සපයන්නකු වෙත ද, එකී සමථකරණ සේවා සපයන්නා විසින් අදාළ රීතිවලට අනුකූලව සමථකාරවරයකු පත් කිරීම සඳහා පියවර ගනු ලැබිය යුතු අතර, අධිකරණයේ ආඥාව ලැබුණු දිනයේ සිට දින හැටක් ඇතුළත සමථකරණය අවසන් කරනු ලැබිය යුතු ය.

(3) සමථකරණයක් අතරතුර දී, (2) වන උපවගන්තියේ සඳහන් කාලසීමාව ඇතුළත සමථකරණය සම්පූර්ණ කිරීමට නොහැකි වන බවට පෙනී යන සහ නිරවුල් කිරීම සඳහා අවස්ථාවන් පවතින බව සමථකාරවරයාගේ සහ පාර්ශ්වයන්ගේ මතය වන සහ ඒ කාලසීමාව ඉක්මවා සමථකරණය අඛණ්ඩව පවත්වාගෙන යාමට අදහස් කරනු ලබන අවස්ථාවක දී, ඒ අනුව එය සමථකරණ සේවා සපයන්නා වෙත දැනුම් දිය යුතු අතර, පාර්ශ්වයන් විසින් සමථකරණය සම්පූර්ණ කිරීම සඳහා නිශ්චිතව දක්වනු ලැබිය යුතු වැඩිදුරටත් වූ කාලසීමාවක් ඉල්ලා සිටිමින් අධිකරණය වෙත ඉල්ලීමක් කළ යුතු අතර, සමථකාරවරයා විසින් සමථකරණය ඉදිරියට පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(4) අධිකරණය විසින්, (3) වන උපවගන්තිය යටතේ ප්‍රදානය කරන ලද වැඩිදුරටත් වූ කාලසීමාව ඉකුත් වීමෙන් පසුව, අවස්ථාවෝචිත පරිදි, පාර්ශ්වයන් විසින් හෝ සමථකරණ සේවා සපයන්නා විසින් අදාළ වන පරිදි (5) වන හෝ (6) වන උපවගන්තිවලට අනුකූලව ඉදිරි කටයුතු කර ගෙන යනු ලැබිය යුතු ය.

(5) අධිකරණය විසින් එවැනි යම් යොමු කිරීමක් කරනු ලබන අවස්ථාවක දී, සමථකරණය ක්‍රියාත්මක කරමින් නිරවුල් කිරීමේ ගිවිසුමකට එළඹ ඇති විට, 23 වන වගන්තියේ සඳහන් ලේඛන සමග නිරවුල් කිරීමේ ගිවිසුම පාර්ශ්වයන් විසින් අධිකරණයේ ගොනු කරනු ලැබිය යුතු අතර නිරවුල් කිරීමේ ගිවිසුමේ යම් පාර්ශ්වයක් විසින් 26 වන වගන්තියේ සඳහන් යම් හේතුවක් මත තීන්දු ප්‍රකාශයක් ඇතුළත් නොකළ යුතු බවට ඔප්පු කරනු ලබන්නේ නම් මිස, එහි නියමයන් අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ලෙස ඇතුළත් කළ යුතු අතර එසේ ඔප්පු කරනු ලබන අවස්ථාවක දී, අධිකරණය විසින් කිසිදු නිරවුල් කිරීමක් ඇති කර නොගත් ලෙසට සලකා ඒ කාරණය විභාග කොට තීරණය කිරීමට කටයුතු කරනු ලැබිය යුතු ය.

(6) අධිකරණය විසින් එවැනි යම් යොමු කිරීමක් සිදු කිරීමෙන් පසුව, නිරවුල් කිරීමකට නොඑළඹුන අවස්ථාවක දී, සමථකරණ සේවා සපයන්නා විසින් අධිකරණය වෙත ඒ අනුව වාර්තා කරනු ලැබිය යුතු අතර, යම් පාර්ශ්වයක් නොපැමිණීම හේතුවෙන් නිරවුල් කිරීමක් සිදු කිරීමට නොහැකි වූ අවස්ථාවක දී, ඒ පාර්ශ්වය වෙත යවන ලද දැන්වීමෙහි තොරතුරු සහ ඒ පාර්ශ්වය නොපැමිණි දින ලබා දෙමින් ඒ කාරණය සඳහන් කරනු ලැබිය යුතු අතර, ඉනික්බිතිව අධිකරණය විසින් ඒ කාරණය විභාග කොට තීරණය කරනු ලැබිය යුතු ය.

සමථකරණයක් ආරම්භ කළ හැකි ආකාරය

**8.** (1) (අ) සමථකරණ ගිවිසුමක් ඇති විට සහ එහි සමථකරණ සේවා සපයන්නකු නම් කර ඇති අවස්ථාවක දී, ආරාවුලක් පැන නැඟී ඇති බවට ආරාවුලේ පාර්ශ්වකරුවකු විසින් සමථකරණ සේවා සපයන්නා වෙත ලිඛිත දැන්වීමක් ලබාදෙමින් සහ සමථකරණ කටයුතු ආරම්භ කරන ලෙස ඉල්ලා සිටිමින් සහ ආරාවුලේ අනෙක් පාර්ශ්වයට හෝ පාර්ශ්වයන්ට දැන්වීමෙහි පිටපතක් යැවීම මගින්; හෝ

(ආ) සමථකරණ ගිවිසුමක් ඇති විට සහ එහි සමථකරණ සේවා සපයන්නකු නම් කර නොමැති අවස්ථාවක දී, යම් පාර්ශ්වයක් විසින් ආරාවුලේ අනෙක් පාර්ශ්වයට හෝ පාර්ශ්වයන්ට ආරාවුල සමථකරණයට යොමු කරනු ලබන බවට වන ලිඛිත දැන්වීමක් යවමින් සහ ඒ දැන්වීමෙහි පිටපතක් යැවිය යුතු සමථකරණ සේවා සපයන්නකු නම් කරමින්; හෝ

(ඇ) සමථකරණ ගිවිසුමක් නොමැති අවස්ථාවක දී -

(i) එකඟ වී ඇත්නම්, යම් සමථකාරවරයකුගේ නම් කිරීමක් ඇතුළත් විය හැකි, සමථකරණය ආරම්භ කිරීම සඳහා වන ලිඛිත දැන්වීමක් එකඟ වී සිටින සමථකරණ සේවා සපයන්නා වෙත ආරාවුලේ පාර්ශ්වයන් විසින් එක්ව ඉදිරිපත් කරමින්; හෝ

(ii) යම් පාර්ශ්වයක් විසින් ආරාවුලේ අනෙක් පාර්ශ්වයට හෝ පාර්ශ්වයන්ට ආරාවුල සමථකරණයට යොමු කිරීමට ආරාධනයක් යවමින් සහ ඒ ආරාධනයෙහි පිටපතක් යැවිය යුතු සමථකරණ සේවා සපයන්නකු නම් කරමින්,

යම් ආරාවුලක් සමථකරණය කිරීම ආරම්භ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ (ii) වන අනුඡේදයේ විධිවිධාන සලස්වා ඇති පරිදි ආරාවුල සමථකරණයට යොමු කිරීමට අනෙක් පාර්ශ්වයට හෝ පාර්ශ්වයන්ට ආරාධනා කරන ලද පාර්ශ්වය වෙත එම ආරාධනය යවන ලද දිනයේ සිට දින තිහක කාලසීමාවක් ඇතුළත හෝ ආරාධනයේ නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් කාලසීමාවක් ඇතුළත හෝ ආරාධනය පිළිබඳ පිළිගැනීමක් නොලැබුණහොත්, ඒ ආරාධනය යවන ලද පාර්ශ්වය විසින් එම ආරාධනය ප්‍රතික්ෂේප කිරීමක් වශයෙන් සළකනු ලැබිය හැකි ය.

(3) ඉහත (1) වන උපවගන්තිය ප්‍රකාරව යම් පාර්ශ්වයක් විසින් ආරාවුලක් සමථකරණය කිරීම ආරම්භ කරනු ලබන අවස්ථාවක දී, සමථකරණ සේවා සපයන්නා විසින් දැන්වීම ලැබුණු වහාම, සමථකාරවරයකු පත් කර සමථකරණය ආරම්භ කිරීමට අවශ්‍ය යම් පියවර ගැනීමට කටයුතු කරනු ලැබිය යුතු ය.

සමථකාරවරයකු පත් කිරීම

**9.** (1) සමථකරණයක් සිදු කිරීමේ කාර්යය සඳහා සමථකාරවරුන් දෙදෙනකු හෝ ඊට වැඩියෙන් සිටිය යුතු බවට පාර්ශ්වයන් එකඟ වී ඇත්නම් මිස, එක් සමථකාරවරයකු සිටිය යුතු ය.

(2) යම් සමථකාරවරයකු පිළිබඳව එකඟතාවයකට එළඹීමට පාර්ශ්වකරුවන් උත්සාහ කළ යුතු අතර, පාර්ශ්වයන් හට එසේ එකඟ වීමට නොහැකි අවස්ථාවක දී, සමථකරණ සේවා සපයන්නා විසින් ආරාවුලේ ස්වභාවය, පාර්ශ්වයන්ගේ මනාපය සහ පත්වීම්ලාභියාගේ සුදුසුකම්, සුදුසුභාවය සහ කටයුත්තෙහි යෙදිය හැකි බව යන කරුණු කෙරෙහි සැලකිල්ල යොමු කරමින් එක් සමථකාරවරයකු හෝ සමථකාරවරුන් කිහිපදෙනකු හෝ පත් කරනු ලැබිය යුතු ය.

සමථකරණය ආරම්භ කිරීම

**10.** සමථකාරවරයකු පත් කළ දිනයේ දී ආරාවුලක් සමථකරණය ආරම්භ කළ ලෙස සැළකිය යුතු ය.

සමථකරණය කිරීම සඳහා අසාධාරණ ලෙස ප්‍රතික්ෂේප කිරීම නඩු ගාස්තුවලට යටත් විය යුතු බව

**11.** අධිකරණයක් විසින්, යම් සිවිල් හෝ වාණිජ ආරාවුලක් සම්බන්ධයෙන් වන යම් නඩුවක දී හෝ නඩු කටයුත්තක දී නඩු ගාස්තු ප්‍රදානය කිරීමේ දී යම් පාර්ශ්වයක් විසින් සමථකරණය සඳහා සහභාගි වීම අසාධාරණ ලෙස ප්‍රතික්ෂේප කර තිබේ ද යන්න සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

සමථකරණයක් සඳහා පාර්ශ්වයන් සතු යුතුකම්

**12.** සමථකරණය මගින් ආරාවුල නිරවුල් කිරීමට සද්භාවයෙන් යුතුව උත්සාහ කිරීම, මේ පනතේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව රහස්‍යභාවය පවත්වා ගැනීම සහ සමථකරණයක් සිදු කිරීමේ දී අදාළ වන්නා වූ රීතිවලට අනුකූලව කටයුතු කිරීම යම් සමථකරණයක පාර්ශ්වයන්ගේ යුතුකම සහ වගකීම විය යුතු ය.

යම් පාර්ශ්වයකට සෘජුවම සමථකරණයෙහි යෙදිය හැකි බව

**13.** (1) යම් ආරාවුලක පාර්ශ්වකරුවකුට සමථකරණයේ සෑම අදියරයක දී ම සෘජුව සමථකරණයේ යෙදීමට හිමිකම ඇති අතර, එසේ යෙදීමට නියම කරනු ලැබිය යුතු අතර, වෙනත් යම්

තැනැත්තකු විසින් එවැනි පාර්ශ්වකරුවකු නියෝජනය කිරීම සිදු නොකළ යුතු ය.

(2) යම් පාර්ශ්වයක් විසින් නීතිඥවරයකු ඇතුළුව යම් පාර්ශ්වයකට විසඳුමක් ඇති කර ගැනීමට සහාය විය හැකි වෙනත් යම් තැනැත්තකු සමඟ සමථකරණයට සහභාගී වීමට තෝරා ගැනීම කළ හැකි අතර, ඒ වෙනත් යම් තැනැත්තා විසින්, ඒ පාර්ශ්වයේ ඉල්ලීම මත සමථකාරවරයා විසින් සමථකරණ ක්‍රියාවලිය කළමනාකරණය කිරීම සහ පාලනය කිරීමට යටත්ව, ඒ පාර්ශ්වය වෙනුවෙන් ප්‍රකාශ සිදු කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාපිත මණ්ඩලයක් හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ නෛතික පුද්ගලභාවයක් ඇති වෙනත් අස්තිත්වයක් හෝ රජයේ දෙපාර්තමේන්තුවක් හෝ වෙනත් ආයතනයක් වන යම් පාර්ශ්වයක් වෙනුවෙන් නිරවුල් කිරීමක් ඇති කර ගැනීමට සහ නිරවුල් කිරීමකට එකඟ වීමට කථා කිරීම සඳහා ලිඛිතව ලබාදෙන ලද නිසි අධිකාරි මට්ටමක් සහිත නිලධරයකු විසින් ඒ පාර්ශ්වය නියෝජනය කරනු ලැබිය යුතු ය.

සමථකරණ සේවා සපයන්නාගේ යුතුකම්

**14.** (1) සමථකරණ සේවා සපයන්නකු විසින් සමථකරණය සිදු කිරීම සඳහා සමථකාරවරයාට පරිපාලනමය සහාය ලබාදිය යුතු අතර, ඒ කාර්යය සඳහා පහත දැක්වෙන නියමයන්ට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය :-

(අ) සමථකාරවරුන් පත් කිරීම සඳහා වන කාර්යපටිපාටිය, රහස්‍යභාවය සම්බන්ධයෙන් වන නීතිය අනුගමනය කිරීම සහ අගති රහිතව කටයුතු කිරීම, පාර්ශ්වයන්ගේ ස්වාධීනත්වය පිළිබඳ මූලධර්මය අනුගමනය කිරීම, සමථකරණ ක්‍රියාවලියේ විශ්වාසභාවය, පාර්ශ්වයන්ගේ සහ සමථකාරවරයාගේ භූමිකාවන් සහ සමථකරණ ක්‍රියාවලිය සිදු කිරීම යනාදිය ඇතුළත්ව නමුත් ඒවාට සීමා නොවී සමථකරණයන් සිදු කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ යම් රීති සම්මත කර ගැනීම; සහ

(ආ) 15 වන වගන්තියේ දක්වා ඇති නියමයන් ඇතුළත් විය යුතු සමථකාරවරයන් සඳහා වන ආචාර ධර්ම සංග්‍රහයක් සම්මත කර ගැනීම.

(2) (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල පිළිවෙළින් දක්වා ඇති පරිදි රීති සහ ආචාරධර්ම සංග්‍රහයක් සම්මත කරගෙන නොමැති සමථකරණ සේවා සපයන්නකු විසින් සමථකරණ සේවා පරිපාලනය කිරීම සඳහා වන ඉල්ලුම්පත්‍ර හෝ ඉල්ලීම් භාරගැනීම සිදු නොකළ යුතු අතර, සමථකරණ සේවා පරිපාලනය කිරීම සිදු නොකළ යුතු ය.

සමථකාරවරුන්ගේ යුතුකම්

**15.** යම් සමථකාරවරයකු විසින් සෑම අවස්ථාවකදී ම, සමථකරණ ක්‍රියාවලියේ විශ්වාසභාවය පවත්වාගෙන යන බවට සහතික විය යුතු අතර එකී කාර්යය සඳහා සමථකරණයන් සිදු කිරීමේ දී පහත සඳහන් දෑ අනුගමනය කරනු ලැබිය යුතු ය :-

(අ) සමථකරණ ක්‍රියාවලිය, සමථකාරවරයාගේ ප්‍රරෝධක නොවන භූමිකාව සහ පාර්ශ්වයන්ගෙන් අපේක්ෂා කරනු ලබන භූමිකාව පාර්ශ්වයන් වෙත පැහැදිලි කිරීම;

(ආ) පිළිගත හැකි දැනුවත්භාවයෙන් යුත් සහ ස්වේච්ඡා සහගත විසඳුමක් ඇතිකර ගැනීමට පාර්ශ්වයන් වෙත සහාය වීම සඳහා උචිත වන්නා වූ යම් කුසලතා සහ ශිල්පීය ක්‍රම භාවිත කිරීම සහ ඔවුන් මත ආරාවුලට විසඳුමක් පනවනු ලැබීම සිදු නොකිරීම;

(ඇ) කාලෝචිත, සාධාරණ, අපක්ෂපාති, මධ්‍යස්ථ සහ පිරිවැය සාඵල්‍ය ආකාරයකින් සමථකරණය සිදු කිරීම;

(ඈ) සමථකරණය සිදු කිරීමේ සියලුම අවස්ථාවල දී ආරාවුලේ පාර්ශ්වයන්ගේ විශ්වාසය පවත්වාගෙන යාම;

(ඉ) අවස්ථානුගත කරුණුවල දී සුදුසු යයි සළකනු ලබන පරිදි සියලු පාර්ශ්වයන් සමඟ එක්ව මෙන්ම වෙන් වෙන් වශයෙන් අවශ්‍ය විය හැකි පරිදි සමථ කිරීමේ සාකච්ඡා ගණනාවක් පැවැත්වීම;

(ඊ) සමථකරණය අතරතුර සහ සමථකරණයෙන් පසුව බැඳියාවන් අතර ගැටීමක් හෝ බැඳියාවන් අතර

ගැටීමක ස්වභාවයක් ඇති වීම වැළැක්වීම සහ ඒ කාර්යය සඳහා අවස්ථානුගත කරුණු මගින් සත්‍ය හෝ ප්‍රත්‍යක්ෂ බැඳියාවන් අතර ගැටීමක් වැළැක්වීම වළක්වාලන්නේ නම් සමථකරණය ප්‍රතික්ෂේප කිරීම හෝ සමථකරණයෙන් ඉල්ලා අස්වීමට කැමැත්ත පළ කිරීම;

(උ) සමථකාරවරයකු ලෙස පත්වීම භාර ගැනීමට පෙර හෝ සමථකරණය අතරතුරදී යම් අවස්ථාවක දී හෝ යම් සත්‍ය හෝ ප්‍රත්‍යක්ෂ බැඳියාවන් අතර ගැටීමක් පිළිබඳව දැනගත් විගස ඒ තත්ත්වය පිළිබඳව පාර්ශ්වයන්ට අනාවරණය කිරීම සහ පාර්ශ්වයන්ගේ ලිඛිත කැමැත්ත මත පමණක් සමථකාරවරයාගේ භූමිකාව පිළිගැනීම හෝ ඒ භූමිකාවේ අඛණ්ඩව රැඳී සිටීම හෝ සිදු කිරීම;

(ඌ) 16 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව, සමථකරණ ක්‍රියාවලිය අතරතුර පවත්වාගෙන යනු ලබන සටහන් සම්බන්ධයෙන් සහ යම් තොරතුරු රහස්‍යභාවයෙන් තබා ගත යුතු බවට සහ එය අනෙක් පාර්ශ්වයට හෝ පාර්ශ්වයන්ට අනාවරණය නොකළ යුතු බවට වන නිශ්චිත කොන්දේසියක් මත යම් පාර්ශ්වයක් විසින් හෙළිදරව් කරන ලද යම් තොරතුරු ඇතුළත්ව සමථකරණයක රහස්‍යභාවය පවත්වාගෙන යාම;

(එ) සමථකාරවරුන් සඳහා අදාළ වන්නා වූ ආචාර ධර්ම සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම; සහ

(ඒ) පාර්ශ්වයන් විසින් එකඟ වූ යම් නියමවලට අනුකූලව සමථකරණය සිදු කිරීම.

සමථකරණ කටයුතුවල රහස්‍යභාවය

**16.** (1) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සමථකාරවරයා, සමථකරණයේ පාර්ශ්වයන් සහ ආරාවුලක් නිරවුල් කිරීම සඳහා සමථකරණයක දී සහභාගී වන වෙනත් සියලු තැනැත්තන් පහත දැක්වෙන කාරණා ද ඇතුළුව සමථකරණය

අතරතුර දී සාකච්ඡා කරන ලද කාරණා සම්බන්ධයෙන් රහස්‍යභාවය පවත්වාගෙන යනු ලැබිය යුතු ය:-

(අ) යම් පාර්ශ්වයක් විසින් කරන ලද ප්‍රකාශ, පළ කරන ලද අදහස්, නිරවුල් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද විකල්ප සහ යෝජනා;

(ආ) යම් පාර්ශ්වයක් විසින් හෝ යම් වෘත්තිකයකු විසින් ඉදිරිපත් කරනු ලබන අර්ථ නිරූපණ;

(ඇ) සමථකරණයෙහි යෙදීමට යම් පාර්ශ්වයක් විසින් ආරාධනා කිරීම හෝ යම් පාර්ශ්වයක් සමථකරණයට සහභාගී වීමට කැමැත්තෙන් සිටි බවට වන කාරණය;

(ඈ) යම් පාර්ශ්වයක් විසින් නිරවුල් කිරීම සඳහා කරන ලද යම් යෝජනා පිළිගැනීමට කැමැත්තෙන් සිටි බවට හෝ කැමැත්තෙන් නොසිටි බවට වන කාරණය; සහ

(ඉ) සමථකරණය සඳහා මූලික වශයෙන් සකස් කරන ලද ලේඛනයක්.

(2) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව සමථකරණයක් අතරතුර දී (1) වන උපවගන්තියේ සඳහන් යම් කාරණයක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් කරන ලද සියලු ප්‍රකාශ අගති රහිතව කරනු ලැබිය යුතු අතර, අනාවරණය කිරීම, නීතිය යටතේ නියම කර ඇති විට හෝ නිරවුල් කිරීමේ ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා හෝ මිස, යම් අධිකරණයක දී හෝ යම් බේරුම්කරණයක දී හෝ වෙනත් ආරාවුල් විසඳීමේ ක්‍රියාවලියක දී සාක්ෂි වශයෙන් ආවේශ්‍යා නොවිය යුතු අතර, ඒ අනුව සමථකරණයක කිසිදු පාර්ශ්වයක් විසින් එවැනි යම් කාරණයක් යම් අධිකරණයක දී, බේරුම්කරණ හෝ වෙනත් ක්‍රියාවලියක දී සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීමට අපේක්ෂා නොකළ යුතු අතර අධිකරණය, බේරුම්කරණ විනිශ්වය සභාව හෝ වෙනත් අධිකාරියක් විසින් ඒ කාරණා සැළකිල්ලට නොගත යුතු ය.

(3) බේරුම්කරණ, අධිකරණ හෝ වෙනත් ආරාවුල් නිරවුල් කිරීමේ නඩු කටයුතුවල දී අන්‍යාකාරයෙන් ආවේශ්‍ය වන සාක්ෂි සමථකරණයක දී භාවිත කර තිබීමේ හෝ අනාවරණය වී තිබීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආවේශ්‍ය නොවන බවට පත් නොවිය යුතු ය.

(4) සමථකරණයේ පාර්ශ්වයන්, සමථකරණ සේවා සපයන්නා සහ සමථකාරවරයා ඇතුළුව කිසිදු තැනැත්තකු විසින් සමථකරණ කටයුතු පෞද්ගලිකව හෝ අතථ්‍ය ලෙස හෝ පැවැත්වූව ද, සමථකරණ කටයුතුවල ශ්‍රව්‍ය හෝ දෘශ්‍ය පටිගත කිරීමක් සිදු නොකළ යුතු ය.

**17**. පහත දැක්වෙන අවස්ථාවල දී සමථකරණයක් අවසන් කළ යුතු ය :- සමථකරණය අවසන් කිරීම

(අ) පාර්ශ්වයන් විසින් නිරවුල් කිරීමේ ගිවිසුමක් අත්සන් කර ඇති අවස්ථාවක දී; හෝ

(ආ) පහත දැක්වෙන යම් අවස්ථානුගත කරුණුවල දී නිරවුල් කිරීමකින් තොරව සමථකරණය අවසන් කළ බවට සමථකාරවරයා විසින් ප්‍රකාශයක් සිදු කරනු ලබන අවස්ථාවක දී -

(i) සමථකරණයේ ප්‍රගතිය සලකා බැලීමේ දී සමථකරණය සඳහා තවදුරටත් උත්සාහ කිරීම් නිශ්ඵල වන්නා වූ සහ ආරාවුල් නිරවුල් කිරීමක් සිදුවීමේ හැකියාවක් නොමැති වන්නා වූ අවස්ථාවක දී;

(ii) යම් පාර්ශ්වයක් විසින් තමන් සමථකරණයෙන් ඉල්ලා අස්වන බවට ලිඛිතව සමථකාරවරයාට දැනුම් දෙනු ලබන අවස්ථාවක දී; හෝ

(iii) සියලු පාර්ශ්වයන් විසින් ඔවුන් සමථකරණ කටයුතු අවසන් කිරීමට අදහස් කරනු ලබන බවට ලිඛිතව සමථකාරවරයාට දැනුම් දෙනු ලබන අවස්ථාවක දී.

නිරවුල් කිරීමේ ගිවිසුම

**18.** (1) නිරවුල් කිරීමේ නියමයන් මත පාර්ශ්වයන් විසින් එකඟතාවයකට එළඹී ඇති අවස්ථාවක දී, පාර්ශ්වයන් විසින් නිරවුල් කිරීමෙහි නියමයන් සහ එයින් හටගන්නා බැඳියාවන් පැහැදිළිව අවබෝධ කර ගෙන ඇති බවට සමථකාරවරයා සෑහීමට පත්වීමෙන් අනතුරුව, නිරවුල් කිරීමේ නියමයන් නිරවුල් කිරීමේ ගිවිසුමේ ලිඛිතව දක්වා ඇති බවට සහ පාර්ශ්වයන් විසින් එය අත්සන් කරන ලද බවට සමථකාරවරයා සහතික විය යුතු ය.

(2) පාර්ශ්වයන් විසින් එසේ අත්සන් කරන ලද නිරවුල් කිරීමේ ගිවිසුම සමථකරණයේ ප්‍රතිඵලයක් ලෙස ඇති කරගත් බව සහතික කරමින් සමථකාරවරයා හෝ සමථකරණ සේවා සපයන්නාගේ බලයලත් නිලධරයකු විසින් ඒ නිරවුල් කිරීමේ ගිවිසුම ලියා සහතික කරනු ලැබිය යුතු අතර එහි මුල් පිටපත් එක් එක් පාර්ශ්වයන් වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

නිරවුල් කිරීමේ ගිවිසුමේ බන්ධනීය ස්වභාවය

**19.** (1) නිරවුල් කිරීමේ ගිවිසුමක් ඒ නිරවුල් කිරීමේ ගිවිසුමේ පාර්ශ්වයන් අතර බන්ධනීය විය යුතු අතර වලංගු ගිවිසුමක් ලෙස නීතියෙන් බලාත්මක විය යුතු ය:

එසේ වුව ද, නිරවුල් කිරීමේ ගිවිසුමේ නියමයන්, ඒ නිරවුල් කිරීමේ ගිවිසුමේ පාර්ශ්වයන් නොවන තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට, බලපෑමක් ඇති නොකළ යුතු ය.

(2) නිරවුල් කිරීමේ ගිවිසුමක යම් පාර්ශ්වයක් විසින් ඒ නිරවුල් කිරීමේ ගිවිසුම ප්‍රකාරව නිරවුල් කර තිබෙන යම් කාරණයක් සම්බන්ධයෙන් ඒ ගිවිසුමේ වෙනත් පාර්ශ්වයකට එරෙහිව අධිකරණයේ නඩු කටයුතු පවරනු ලබන අවස්ථාවක දී, ඒ කාරණය විභාග කොට තීන්දු කිරීමට අධිකරණයට අධිකරණ බලය නොමැත්තේ ය.

අධිකරණ කටයුතුවල දී නිරවුල් කිරීමේ ගිවිසුමක ආවේශ්‍යතාවය

**20.** (1) යම් අධිකරණ කටයුත්තක දී, ඒ කටයුත්තේ පාර්ශ්වයක් විසින් නිරවුල් කිරීමේ ගිවිසුමක් ප්‍රකාරව දැනටමත් නිරවුල් කර ඇති බවට අයැද සිටිනු ලබන යම් කාරණයක් සම්බන්ධයෙන් ආරාවුලක් පැන නැගී ඇති අවස්ථාවක දී, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ කාරණය දැනටමත් නිරවුල් කර ඇති බව තහවුරු කිරීම සඳහා සාක්ෂි වශයෙන් නිරවුල් කිරීමේ ගිවිසුම ආවේශ්‍ය කරගනු ලැබිය යුතු ය.

(2) යම් අධිකරණ කටයුත්තක දී, යම් නිරවුල් කිරීමේ ගිවිසුමක් සාක්ෂි වශයෙන් පිළිගන්නා ලෙස ඉල්ලීමක් කර ඇති අවස්ථාවක දී, 22 වන වගන්තිය ප්‍රකාරව නිරවුල් කිරීමේ ගිවිසුමේ යම් පාර්ශ්වයක් විසින් කරන ලද ඉල්ලීමක දී මහාධිකරණය විසින් 26 වන වගන්තිය ප්‍රකාරව ඒ නිරවුල් කිරීමේ ගිවිසුම සම්බන්ධයෙන් අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරමින් ආඥාවක් ලබා දී ඇත්නම් මිස, නිරවුල් කිරීමේ ගිවිසුම සාක්ෂි වශයෙන් පිළිගන්නා ලෙස කරන ලද ඒ ඉල්ලීමට අවසර ලබාදිය යුතු අතර ඒ නඩු කටයුතුවල දී නිරවුල් කිරීමේ ගිවිසුමේ වලංගුභාවය අභියෝගයට ලක් කිරීමට අවසර ලබා නොදිය යුතු ය.

(3) යම් අධිකරණ කටයුත්තක දී, නිරවුල් කිරීමේ ගිවිසුමක් සාක්ෂි වශයෙන් පිළිගන්නා ලෙස ඉල්ලීමක් කරනු ලබන සහ ඒ නිරවුල් කිරීමේ ගිවිසුමේ පාර්ශ්වයක් විසින් ඒ ගිවිසුම සාක්ෂි වශයෙන් පිළිගැනීමට විරෝධය ප්‍රකාශ කරනු ලබන සහ යම් කවර හෝ පාර්ශ්වයක් විසින් 22 වන වගන්තිය යටතේ අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් සඳහා ඉල්ලීමක් කර නොමැති හෝ යම් පාර්ශ්වයක් විසින් කරන ලද එවැනි යම් ඉල්ලීමක් මත අධිකරණයේ ආඥාව ලබා දීමට නියමිතව ඇති අවස්ථාවක දී, අධිකරණය විසින් අවස්ථාවෝචිත පරිදි -

(අ) නිරවුල් කිරීම අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ලෙස ඇතුළත් කර ගැනීමට 22 වන වගන්තිය ප්‍රකාරව ඉල්ලීමක් කිරීම සඳහා ඒ නිරවුල් කිරීමේ ගිවිසුම පිළිගනු ලබන ලෙස අයැද සිටින පාර්ශ්වයට නියෝග කරමින් ආඥාවක් කිරීම සහ නඩු කටයුතු නතර කිරීම; හෝ

(ආ) මහාධිකරණය විසින් ආඥාව කරනු ලබන තෙක් නඩු කටයුතු නතර කිරීම,

කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ (අ)ඡේදය යටතේ ආඥාවක් නිකුත් කරන ලද්දේ යම් පාර්ශ්වයක් වෙත ද, ඒ පාර්ශ්වය විසින් 22 වන වගන්තියේ සඳහන් කාලසීමාව නොසළකා ඒ ආඥාව කරන ලද

දින සිට දින තිහක් ඇතුළත පනතේ 22 වන වගන්තිය ප්‍රකාරව ඉල්ලීමක් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

නිරවුල් නොකිරීමේ සහතිකය

**21**. (1) නිරවුල් කිරීමකින් තොරව සමථකරණය අවසන් කරන ලද බවට සමථකාරවරයා ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක දී, සමථකාරවරයා විසින් එක් එක් පාර්ශ්වයන් වෙත නිරවුල් නොකිරීමේ සහතිකයක් අත්සන් කර නිකුත් කරනු ලැබිය යුතු අතර ඒ සහතිකයේ ආරාවුල පිළිබඳ කෙටි විස්තරයක් සහ එම ආරාවුල සමථකරණය මගින් නිරවුල් කිරීමට යොමු කළ බවට සහ නිරවුල් කිරීමක් ඇති නොවූ බවට වන ප්‍රකාශයක් අන්තර්ගත විය යුතු අතර සමථකරණයට සහභාගී වීමට නියම කරමින් යවන ලද දැන්වීම් නොසලකා යම් පාර්ශ්වයක් විසින් නොපැමිණීම හේතුවෙන් සමථකරණය කරගෙන යාමට නොහැකි වුවහොත්, යවන ලද දැන්වීම්වල තොරතුරු සහ ඒ පාර්ශ්වය නොපැමිණි දින ලබා දෙමින් ඒ කාරණය ඒ සහතිකයේ සඳහන් කරනු ලැබිය යුතු ය.

(2) යම් නිරවුල් නොකිරීමේ සහතිකයක්, එහි සඳහන් ආරාවුල සමථකරණයට යොමු කර ඇති බවටත් සහ එහි නිරවුල් කිරීමක් සිදුව නොමැති බවටත් තහවුරු කිරීම සඳහා අවසානාත්මක සහ තීරණාත්මක සාක්ෂියක් වශයෙන් ආවේශ්‍ය කරගනු ලැබිය යුතු ය.

නිරවුල් කිරීම අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් වශයෙන් ඇතුළත් කර ගැනීම සඳහා වන ඉල්ලීම

**22**. (1) නිරවුල් කිරීමේ ගිවිසුමක යම් පාර්ශ්වයක් විසින් ඒ නිරවුල් කිරීමේ ගිවිසුමේ දින සිට මාස දොළහක කාලයක් ඇතුළත නිරවුල් කිරීම අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ලෙස ඇතුළත් කර ගැනීම සඳහා මහාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) යම් නිරවුල් කිරීමේ ගිවිසුමක පාර්ශ්වයකට ඒ නිරවුල් කිරීමේ ගිවිසුම ප්‍රකාරව පවතින හෝ එයින් හටගන්නා යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිකර්මයක් (1) වන උපවගන්තිය යටතේ ඒ පාර්ශ්වය විසින් කරන ලද ඉල්ලීමක් මගින් හෝ එවැනි ඉල්ලීමක් සිදු නොකිරීම මගින් හෝ බලපෑමට ලක් වීම, සීමා වීම හෝ පරිසීමා වීම සිදු නොවිය යුතු ය.

අධිකරණයේ දී ඉදිරිපත් කළ යුතු ලේඛන

**23.** 20 වන වගන්තියේ කාර්යය සඳහා නිරවුල් කිරීමේ ගිවිසුමක් පිළිගනු ලබන ලෙස අයැද සිටින හෝ 22 වන වගන්තිය යටතේ ඉල්ලීමක් කරනු ලබන හෝ යම් පාර්ශ්වයක් විසින්,

එම නිරවුල් කිරීමේ ගිවිසුමේ පාර්ශ්වයන් විසින් අත්සන් කරන ලද සහ ඒ නිරවුල් කිරීමේ ගිවිසුම සමථකරණයේ ප්‍රතිඵලයක් ලෙස ඇතිකරගත් බවට තහවුරු කරමින් සමථකාරවරයා හෝ සමථකරණ සේවා සපයන්නාගේ බලයලත් නිලධරයකු විසින් ලියා සහතික කරන ලද ඒ නිරවුල් කිරීමේ ගිවිසුමේ මුල් පිටපත හෝ නිසි පරිදි සහතික කරන ලද පිටපතක් අවස්ථාවෝචිත පරිදි, මහාධිකරණය වෙත හෝ වෙනත් යම් අධිකරණයක් වෙත හෝ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

මහාධිකරණය ඉදිරියේ වන නඩු කටයුතු

**24**. (1) 22 වන වගන්තිය යටතේ මහාධිකරණය වෙත කරනු ලබන සෑම ඉල්ලීමක්ම පෙත්සමක සහ දිවුරුම් පෙත්සමක ආකාරයෙන් කරනු ලැබිය යුතු අතර පෙත්සම්කරු හෝ පෙත්සම්කරුවන් හැර නිරවුල් කිරීමේ ගිවිසුමේ සියලු පාර්ශ්වයන් ඒ පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස නම් කරනු ලැබිය යුතු අතර ඒ සම්බන්ධයෙන් ඔවුන් වෙත දැන්වීම් ලබා දිය යුතු ය:

එසේ වුව ද, නිරවුල් කිරීමේ ගිවිසුම ලියා සහතික කරන ලද යම් සමථකාරවරයකු හෝ සමථකරණ සේවා සපයන්නකුගේ යම් බලයලත් නිලධරයකු හෝ නිරවුල් කිරීමේ ගිවිසුමේ පාර්ශ්වයන් ලෙස සලකනු නොලැබිය යුතු අතර වගඋත්තරකරුවන් ලෙස නම් නොකළ යුතු ය.

(2) පෙත්සම සහ දිවුරුම් පෙත්සම ඉදිරිපත් කිරීමෙන් පසුව, වගඋත්තරකරුවන්ට යම් විරෝධතාවයක් ඇත්නම්, ඔවුන්ගේ ඒ විරෝධතා ලිඛිතව සඳහන් කර දිවුරුම් ප්‍රකාශයක් මගින් සනාථ කරමින් ඉදිරිපත් කිරීමට සහ එහි පිටපත් පෙත්සම්කරුට ලබා ගැනීමට කටයුතු සලස්වනු ලැබීම සඳහා ඒ ඉදිරිපත් කිරීමෙන් සති දෙකක් ඇතුළත වන යම් දිනයක් මහාධිකරණය විසින් වගඋත්තරකරුවන් වෙත ලබා දිය යුතු අතර පෙත්සමේ සඳහන් කාරණා පිළිබඳ තීරණය කිරීම සඳහා වගඋත්තරකරුවන් වෙත ලබා දුන් ඒ දිනයේ සිට සති දෙකක් ඇතුළත වන යම් දිනයක් නියම කරනු ලැබිය යුතු ය.

(3) මහාධිකරණය ඉදිරියේ වන නඩු කටයුතුවල දී දිවුරුම් ප්‍රකාශයක් මගින් සාක්ෂි ලබා දිය යුතු ය:

එසේ වුව ද, මහාධිකරණය විසින් සුදුසු යයි සළකනු ලබන අවස්ථාවල දී, දිවුරුම් ප්‍රකාශය මගින් ලබාදෙන ලද සාක්ෂිවලට අමතරව වාචික සාක්ෂි ලබාගත හැකි ය.

සමථකාරවරයකු හෝ නිලධරයකු අත්සන සඳහා සාක්ෂිකරුවන් ලෙස කැඳවීම නොකළ යුතු බව

**25**. අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නිරවුල් කිරීමේ ගිවිසුමක හෝ නිරවුල් නොකිරීමේ සහතිකයක සමථකාරවරයා හෝ සමථකරණ සේවා සපයන්නාගේ බලයලත් නිලධරයකු විසින් තබන ලද අත්සන නිර්ව්‍යාජ වන බවට අධිකරණය විසින් පූර්ව නිගමනය කළ හැකි අතර එය ඔප්පු කිරීම සඳහා සාක්ෂිකරුවකු වශයෙන් එවැනි යම් තැනැත්තකු කැඳවීම නොකළ යුතු ය.

අධිකරණය විසින් තීන්දු ප්‍රකාශයක් ලබා දීම ප්‍රතික්ෂේප කිරීමේ හේතු

**26.** (1) 22 වන වගන්තිය ප්‍රකාරව යම් පාර්ශ්වයක් විසින් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ යම් මහාධිකරණයක් වෙත ද, ඒ මහාධිකරණය විසින්, නිරවුල් කිරීමේ ගිවිසුමේ වෙනත් යම් පාර්ශ්වයක් විසින් -

(අ) නිරවුල් කිරීමේ ගිවිසුමේ යම් පාර්ශ්වයක් ඇතැම් අශක්නුතා යටතේ පසු වූ බවට;

(ආ) නිරවුල් කිරීමේ ගිවිසුමේ නියමවලට අනුව ඒ නිරවුල් කිරීමේ ගිවිසුම අවසානාත්මක නොවන බවට;

(ඇ) නිරවුල් කිරීමේ ගිවිසුමේ බැඳියාවන් -

(i) නිසි පරිදි ඉටු කර ඇති බවට; හෝ

(ii) පැහැදිළි නොවන බවට හෝ අවබෝධ කර ගත නොහැකි බවට;

(ඈ) සමථකාරවරයාට හෝ සමථකරණයට අදාළ වන්නා වූ සම්මතයන් සමථකාරවරයා විසින් බරපතල ලෙස උල්ලංඝනය කර ඇති බව සහ ඒ උල්ලංඝනය කිරීම සිදු නොවූයේ නම් ඒ පාර්ශ්වය විසින් නිරවුල් කිරීමේ ගිවිසුමට නොඑළඹෙන බවට; හෝ

(ඉ) 15(2)(උ) වගන්තියේ දක්වා ඇති පරිදි බැඳියාවන් අතර ඝට්ටනයක් අනාවරණය කිරීමට ඇති තම යුතුකමට අනුකූලව කටයුතු කිරීම සමථකාරවරයා විසින් පැහැර

හැර ඇති බවට සහ එසේ අනාවරණය කිරීම පැහැර හැරීම ඒ පාර්ශ්වයට වැදගත් බලපෑමක් හෝ අනිසි බලපෑමක් ඇති කළ බවට සහ ඒ පැහැර හැරීම සිදු නොවන්නට ඒ පාර්ශ්වය නිරවුල් කිරීමේ ගිවිසුමට නොඑළඹෙන බවට,

ඔප්පු කරනු ලැබුවහොත්, ඒ නිරවුල් කිරීමේ ගිවිසුම සම්බන්ධයෙන් තීන්දු ප්‍රකාශයක් ලබා දීම ප්‍රතික්ෂේප කළ හැකි ය.

(2) තව ද අධිකරණය විසින් -

(අ) තීන්දු ප්‍රකාශයක් ප්‍රදානය කිරීම ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්තියට පටහැනි වන බවට; හෝ

(ආ) ආරාවුලේ විෂය කාරණය ශ්‍රී ලංකාවේ නීති යටතේ සමථකරණය මගින් නිරවුල් කිරීමට හැකියාවක් නොමැති බවට,

තීරණය කරනු ලැබුවහොත්, තීන්දු ප්‍රකාශයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කළ හැකි ය.

අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ඇතුළත් කිරීම

**27.** (1) 22 වන වගන්තිය ප්‍රකාරව ඉල්ලීමක් කර ඇති සහ අයැද සිටින ලද තීන්දු ප්‍රකාශය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා කිසිදු හේතුවක් ඔප්පු කර නොමැති අවස්ථාවක දී, අධිකරණය විසින්, පාර්ශ්වයන් වෙත දැන්වීම ලබා දෙනු ලබන යම් දිනයක දී එම ගිවිසුමට අනුව තීන්දුවක් ඇතුළත් කිරීමට කටයුතු කර ඉන්පසුව තීන්දු ප්‍රකාශයක් ඇතුළත් කළ යුතු ය.

(2) නිරවුල් කිරීමේ ගිවිසුමක් මහාධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ලෙස වාර්තා කර ඇති අවස්ථාවක දී, ඒ තීන්දු ප්‍රකාශය (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන යටතේ එළඹි තීන්දු ප්‍රකාශයක් හා සමානව ම බලාත්මක වන අතර ඒ අනුව තීන්දු ප්‍රකාශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXII වන පරිච්ඡේදයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ බලාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

ඉවත් කිරීම සහ ඉතිරි කිරීම

**28**. (1) 2000 අංක 44 දරන ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) 2000 අංක 44 දරන ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනත ඉවත් කිරීම නොතකා, මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානයේ සියලුම වත්කම් සහ වගකීම් මේ පනත ක්‍රියාත්මක වන දින සිට බලාත්මක වන පරිදි රජය සතු විය යුතු ය.

අර්ථ නිරූපණය

**29**. මේ පනතේ -

"මහාධිකරණය" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාත සඳහා පිහිටුවන ලද සහ 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත යටතේ සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන අදාළ මහාධිකරණය අදහස් වේ;

"ලිඛිතව" යන්නෙන්, විද්‍යුත් සන්නිවේදනයක් ඇතුළුව යම් ආකාරයකින් යම් අන්තර්ගතයක් වාර්තා කිරීම අදහස් වන අතර පසුව පරිශීලනය කිරීම සඳහා එහි ඇතුළත් තොරතුරුවලට ප්‍රවේශ විය හැකි විය යුතු ය;

"සමථකරණය" යන්නෙන්, භාවිත කරනු ලබන්නා වූ ප්‍රකාශන ශෛලිය හෝ ක්‍රියාවලිය සිදු කරනු ලබන පදනම හෝ නොතකා පාර්ශ්වයන් මත ආරාවුලට විසඳුමක් පනවනු ලැබීමේ අධිකාරි බලයක් නොමැති මධ්‍යස්ථ තැනැත්තකු හෝ තැනැත්තන් ("සමථකාරවරයා") වන තෙවන පාර්ශ්වයකගේ සහාය ඇතිව පාර්ශ්වයන් විසින් ඔවුන් අතර පවතින ආරාවුල සම්බන්ධයෙන් සුහද නිරවුල් කිරීමකට එළඹීමට උත්සාහ කරනු ලබන, ක්‍රියාවලියක් අදහස් වේ;

"සමථකරණ සේවා සපයන්නා" යන්නෙන්, සමථකරණයන් පරිපාලනය කිරීම සඳහා සේවා ලබාදෙනු ලබන යම් තැනැත්තකු හෝ අස්ථිත්වයක් අදහස් වේ;

"සමථකාරවරයා" යන්නෙන්, යම් ආරාවුලක් සමථකරණයෙන් නිරවුල් කිරීමේ දී සහාය වීමට පත් කරන ලද මධ්‍යස්ථ තැනැත්තකු වන තෙවන පාර්ශ්වයක් අදහස් වන අතර එක් සමථකරුවකු හෝ එක් සමථකරුවකුට වඩා වැඩි සමථකරුවන් සංඛ්‍යාවක් ඊට ඇතුළත් විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**30.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**උපලේඛනය**

[3 වන වගන්තිය]

1. විවාහය අවලංගු කිරීමක් අපේක්ෂා කරනු ලබන ආරාවුල්.

2. විවාහ ශූන්‍යතාව ප්‍රකාශ කිරීමක් අපේක්ෂා කරනු ලබන ආරාවුල්.

3. සිහිවිකල, බාලවයස්කාර සහ රක්ෂිත තැනැත්තන්ට සහ එම තැනැත්තන්ගේ මුදල්වලට අදාළ ආරාවුල්.

4. භාරකරුවන්ට, දේපළ ආරක්ෂකයන්ට සහ දේපළ භාරගන්නන්ට අදාළ ආරාවුල්.

5. දරුකමට හදාගැනීමට අදාළ ආරාවුල්.

6. උපත් සහ මරණ ලියාපදිංචි කිරීමට අදාළ ආරාවුල්.

7. සියලු දෙනාම බැඳෙන අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා නිශ්චල දේපළ බෙදීමක් අපේක්ෂා කරනු ලබන ආරාවුල්.

8. ප්‍රොබේට් බලපත්‍ර සහ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර නිකුත් කිරීමට අදාළ ආරාවුල්.

9. වස්තුභංගත්ව ආඥාපනත යටතේ සහන අපේක්ෂා කරනු ලබන ආරාවුල්.

10. සියලු දෙනාම බැඳෙන අයිතිවාසිකම්වලට අදාළ අද්මිරාල්ති කාරණාවලට අදාළ ආරාවුල්.

11. විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදු වූ බවට චෝදනා කරනු ලබන ආරාවුල්.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැක.